00143

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය සංවර්ධනය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා වැඩ සටහන -3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2017/2018

**ESD1131/EPD 3331**- මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ පර්යාලෝක

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2019.02.23 වේලාව - ප.ව.02.00 - ප.ව.04.00 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද (03) පමණක් පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයේ ලක්ෂණ තුනක් (03) හා ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයේ ලක්ෂණ දෙකක් (02) දක්වන්න.

02. සුදුසු නිර්වචන යොදාගනිමින් 'ස්වයං ඉගෙනුම' යන යෙදුම පැහැදිළි කරන්න.

03. මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ මාරියා මොන්ටිසෝරිගේ දැක්ම කෙටියෙන් විස්තර කරන්න.

04. මුල් ළමාවියේ සිටම ක්‍රියාකාරී ඉගෙනුම ප්‍රවර්ධනය කිරීමේ වාසි/ප්‍රතිලාභ පහක් (05) දක්වන්න.

05. මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනයේදී 'රූසෝ' ගේ දැක්මෙහි වැදගත්කම පැහැදිළි කරන්න.

06. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයේ මූලික අවධි තුන (03) දක්වන්න.

07. ශ්‍රී ලංකාවේ දක්නට ඇති දිවාසුරැකුම් මධ්‍යස්ථාන වර්ග හතර (04) දක්වන්න.

08. 1972 ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් හඳුන්වා දුන් ප්‍රතිසංස්කරන හතරක් (04) දක්වන්න. (ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන විවිධ වර්ගයේ පවුල් ව්‍යුහයන් නම් කරන්න. (ලකුණු 06)

(ii) ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික පවුල් ව්‍යුහය අතීතයේ සිට වර්තමානය දක්වා වෙනස් වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) කේවල දෙමාපිය පවුල්වල මව්පියන් තම දරුවන් රැක බලා ගැනීමේදී මුහුණ දෙන සමාජ -ආර්ථික ගැටලු තුනක් **(03)** උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

10. (i) ප්‍රාථමික පංතිකාමර තුළ ස්වයං අධ්‍යාපන ප්‍රවර්ධනය කිරීමේ වාසි තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) ප්‍රාථමික සිසුන්ගේ ස්වයං ඉගෙනුම ප්‍රවර්ධනය කිරීම සඳහා සූදානම් කළ හැකි ක්‍රියාකාරකම් තුනක් **(03)** උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 12)

11. (i) ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය තුළ දැකිය හැකි අභියෝග තුනක් **(03)** විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

(ii) එම ගැටලු අවම කර ගැනීම සඳහා ගුරුවරුන් වශයෙන් ගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i) නිර්මාණාත්මක පෙර පාසල් හා ප්‍රාථමික පංතිකාමරයක් පවත්වා ගැනීමේ වැදගත්කම උදාහරණ ඇසුරින් දක්වන්න. (ලකුණු 10)

(ii) පෙරපාසල් දරුවන් සඳහා නිර්මාණාත්මක පන්ති කාමරයක් පවත්වා ගැනීමට ගුරුවරයා සැලසුම් සකස් කළ යුත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. (i) විශේෂ අවශ්‍යතා සහිත ළමුන් යන්න නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සමඟ කටයුතු කිරීමේ දී පෙරපාසල් ගුරුවරුන් මුහුණ දෙන ගැටලු හතරක් **(04)** දක්වන්න. (ලකුණු 06)

(iii) ඉහත ඔබ දක්වන ලද ගැටලු අවම කර ගැනීම සඳහා සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.